රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

..........................

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 ජූනි 08 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ජූලි 04 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011දෙසැම්බර් 31 දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,656,642 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 228,487 ක් විය.

2.2 <u>මූල්‍ය පාලනය</u>

නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ වලංගු කාලය ඉක්මවූ රු.173,985 ක් වටිනා චෙක්පත් 34 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඈ) නියමය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 1,913 | 2,993 | 1,474 |
| (ii) බදු කුලී | 18,504 | 8,034 | 822 |
| (iii) බලපත්‍ර ගාස්තු | 343 | 357 | 80 |
| (iv) වෙනත් ආදායම් | 35,443 | 32,124 | 19,346 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්ත

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 235,315 |
| (ii) මුද්දර ගාස්තු | 312,218 |

2.4 අචල ජංගම වත්කම්

2011 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම් වල අගය රු. 4,049,050 ක් විය.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 2006 අප්‍රේල් 10 දින සිට වැඩ තහනම් කර ඇති ආදායම් පරිපාලක විසින් අයකර තිබූ හිඟ පොදු වෙළඳපල කුලී ආදායමින් රු. 229,791 ක් සභාවට අය කර ගෙන නොතිබුණි.

(ආ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2006 මැයි 15 දිනැති අංක 02 දරන මුද්දර බදු චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපාර 13 ක මුද්දර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.6 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.